21 ඒකකය - අනුපාත(2)

- **අනුපාතයක එක් පදයකට අදාළ ප්‍රමාණය දී ඇති විට මුළු ප්‍රමාණය සෙවීම**
  - පන්තියක සිටින ගැහැණු ළමයි ගණන හා පිරිමි ළමයි ගණන අතර අනුපාතය 4 : 3 වේ. මෙම පන්තියේ සිටින ගැහැණු ළමයි ගණන 24 නම් එම පන්තියේ සිටින මුළු සිසුන් ගණන සොයන්න.

ගැහැණු ළමයි ගණන $= 24$

අනුපාතයේ ගැහැණු ළමයි සඳහා හිමි කොටස $= 4$

අනුපාතයේ කොටස් 1ක් සඳහා ප්‍රමාණය $= 24 \div 4 = 6$

අනුපාතයේ මුළු කොටස් ගණන $= 4 + 3 = 7$

ඒ අනුව පන්තියේ මුලු සිසුන් ගණන $= 6 \times 7 = 42$

අනුපාතයේ මුලු කොටස් ගණන

අනුපාතයේ කොටසක් සඳහා ප්‍රමාණය

- **අනුපාතයක එක් පදයකට අදාළ ප්‍රමාණය දී ඇති විට**
  - බදාම මිශ්‍රණයක් සාදා ඇත්තේ වැලි : සිමෙන්ති : ගල් = 5 : 3 : 2 අනුපාතයෙනි. එම මිශ්‍රණයේ ඇති සිමෙන්ති තාච්චි ගණන 12 නම් මිශ්‍රණයේ ඇති වැලි තාච්චි ගණනත් ගල් තාච්චි ගණනත් සොයමු.

සිමෙන්ති තාච්චි ගණන $= 12$

අනුපාතයේ සිමෙන්ති සඳහා ඇති කොටස $= 3$

අනුපාතයේ කොටස් 1ක් සඳහා ප්‍රමාණය $= 12 \div 3 = 4$

අනුපාතයේ වැලි සඳහා ඇති කොටස් ගණන $= 5$

ඒ අනුව මිශ්‍රණයේ ඇති වැලි තාච්චි ගණන $= 5 \times 4 = 20$

අනුපාතයේ මුලු කොටස් ගණන

අනුපාතයේ කොටසක් සඳහා ප්‍රමාණය

අනුපාතයේ ගල් සඳහා ඇති කොටස් ගණන $= 2$

ඒ අනුව මිශ්‍රණයේ ඇති ගල් තාච්චි ගණන $= 2 \times 4 = 8$

අනුපාතයේ මුලු කොටස් ගණන

අනුපාතයේ කොටසක් සඳහා ප්‍රමාණය

- **ඔබේ ගණිතය පෙළ පොතෙහි 21.3, 21.4 ලෙස ඇති අභ්‍යාස සම්පූර්ණ කරන්න.**